# 17 සොරකම් නොකරව



දුවේ, පුතේ, ඔබ වඩාත් ආදරෙන් ආශා වෙන් ආරක්ෂා කළ දෙයක් ඔබට අහිමි වුවහොත්; පුංචි ඔබට දුකක් දැනෙනවා නේ ද? මොහොතක් සිතන්න. ඔබ තවත් කෙනකුගේ දෙයක් සොරා ගතහොත්; ඒ පුද්ගලයාටත් ඇතිවන්නේ ඔබට දැනෙන දේම මිස අන් කවරක් ද? එබැවින්, දේව දරුවන් ලෙස, කුඩා කල සිට ම සත්වන පනත ආරක්ෂා කිරීමට පුරුදු පුහුණු විය යුතු ය. සත්වන පනත නම්, "සොරකම් නොකරව" යන්න යි. අන් අය සතු දේපළ අයුතු ලෙස තබා ගැනීම හා අලාභහානි කිරීම මෙම පනතින් තහනම් කරයි. එබැවින් සෙල්ලමටවත්, විනෝදයටවත්, විහිළුවටවත් අන් සතු දේ සොරා ගැනීමෙන් වැලකී සිටීමට සිතට ගන්න.

එදිනෙද ජීවිතයේ දී අපට විවිධ ආර්ථික අමාරුකම් ඇති විය හැකි ය. එහෙත් එම අවස්ථාවල දී අප අන් අය සතු දේ සොරා නොගත යුතු ය. ඒ සඳහා අප ආත්ම දමනය යන ධර්ම ගුණය ප්‍රගුණ කළ යුතු වෙමු. තව ද සාධාරණත්වය යන ධර්ම ගුණය ප්‍රගුණ කිරීම අසල් වැසියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, ඔහුට ලැබිය යුතු දෙය දීමටත් අප පුහුණු වේ. එවිට අපට සත්වන පනත ආරක්ෂා කිරීමට පහසු වනු ඇත.

ඒ අනුව අනුන්ගෙන් ඉල්ලා ගත් දෙය හැකි විගස ඔහුට නැවත ලබා දෙන්න. අනුන්ගේ දෙයක් අහුලාගත් විගසින් එය අයිතිකරුවාට හෝ බලධාරියකුට (උදාහරණ :- විදුහල්පතිතුමාට, ගුරුතුමෙකුට) භාර දෙන්න. ජේසුස් වහන්සේ සකේවුස්ට ප්‍රශංසා කළේ ද ඔහු සොරකම අතහැර යහපත් පුද්ගලයකු වීමට ජේසුස් වහන්සේට දුන් පොරොන්දුව නිසා ය: "මම යමකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි" (ලූක් 19:8). ඔහු ස්වෙච්ඡාවෙන් ම තමා කළ සොරකමට වන්දි ගෙව්වේ ය. ඔබටත් දේව දරුවකු විය හැක්කේ වරදක් සිදු වී නම් එය නිවැරදි කර ගැනීමෙනි. එයට වන්දි ගෙවීමෙනි.

මා සතු සියලු දේට මම ආදරය කරමි; ආරක්ෂා කරමි.

එසේ ම →

අන් අය සතු දෑ මම අගය කරමි; ආරක්ෂා කරමි.

ඒ අනුව, වස්තුව, දේපළ අප ලබා ගත යුතු වන්නේ;

★ අවංකව වැඩ කිරීමෙන්
★ කැපවීමෙන් සහ වෙහෙස මහන්සියෙන්
★ මිලට ගැනීමෙන්
★ හුවමාරුකර ගැනීමෙන්
★ තෑගි වශයෙන්
★ උරුම වශයෙන්

මෙවැනි අවංක හා සාධාරණ මාර්ගවලට අමතර ව අන් කිසි ක්‍රමයකින් දේපළ වස්තුව රැස් කිරීම බරපතල වරදකි. දේව දරුකම ප්‍රතික්ෂේප කිරීමකි.

මෙම පනතින් තහනම් වන දෑ

★ සොරකම් කිරීම
★ බලහත්කාරයෙන් ගැනීම
★ අසාධාරණයෙන් ගැනීම
★ අන් සතු දේපළ විනාශ කිරීම

අද සමාජය තුළ සොරකම් සිදුවෙන වෙනත් ආකාර පහත දක්වේ.



සියලු වස්තුවල හිමිකරුවාණන් වහන්සේ දෙවියන් වහන්සේ ය.

එබැවින් සත්වන පනතින් අප බැඳෙන්නේ, දෙවියන් වහන්සේ සතු වස්තූන් ආරක්ෂා කිරීමට යි. දේව දරුවන් ලෙස, දේව අභිමතය පිළිගෙන, තමාට හිමි ව ඇති වස්තූන් සහ දේපළ අරපිරිමැස්මෙන් පරිහරණය කිරීමටත්, වංචා සහගත ලෙස වස්තුව රැස් නොකිරීමටත්, අන් සතු දේපළ විනාශ නොකිරීමටත් ක්‍රියා කළ යුතු වේ.

පුංචි ඔබට ඔබ සතු වගකීම දැන් මතක ද?

## ක්‍රියාකාරකම

1. සාධාරණ ව වස්තුව ලබාගත හැකි මාර්ග **හතරක්** නම් කරන්න.
2. සත්වන පනත මගින් තහනම් කරන ක්‍රියා **හතරක්** ලියා දක්වන්න.
3. "සත්වන පනත රැකීමට මට කළ හැකි දේ" නමින්, වචන 50කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

***ඔබ, ඔබේ සම්පත් ආරක්ෂා කිරීමට උත්සාහ ගන්නවා සේ ම, අන් අයගේත් සම්පත් ආරක්ෂා කිරීමට උත්සාහ කරන්න.***